# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1109/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 05/07/2024 පැය 2055

## මාධ්‍ය නිවේදනය

### අපරාධ මර්දනය කිරීමේ රාජකාරී සඳහා පොලිස් නිල සුනඛ කොට්ඨාසයට තවත් සුනඛයින් 35 දෙනෙකු ලබාදේ.

යුක්තිය මෙහෙයුමට සමගාමීව දිවයින පුරා සිදු කරන මත්ද්‍රව්‍ය වැටලීම් සක්‍රීයව සිදු කරමින් වැටලීම් රාජකාරි තවදුරටත් කාර්යක්ෂමව සිදු කර ගැනීමට සහ අපරාධකරුවන් හඳුනා ගැනීම හා පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා තවත් සුනඛයන් 35 දෙනෙකු නෙදර්ලන්තයේ සිට පොලිස් නිල සුනඛ කොට්ඨාසයට 2024.07.05 වන අද දින රැගෙන එන ලදී.

බෙල්ජියම් මැලිනොයිස් (Belgiam Malinois) වර්ගයේ සුනඛයන් 13 දෙනෙකු, ජර්මන් ෂෙපර්ඩ් (German Shepherd) වර්ගයේ සුනඛයන් 12 දෙනෙකු සහ ඉංග්‍රීෂ් ස්පැනියෙල් (English Spaniel) වර්ගයේ සුනඛයන් 10 දෙනෙකු ද මෙම සුනඛයන් අතර සිටී. එම සුනඛයන් පොලිස් නිල සුනඛ කොට්ඨාසයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රියන්ත කුලසේකර මහතා සහ නිල සුනඛ කොට්ඨාසයේ පශු වෛද්‍ය අමල් දිසානායක මහතා විසින් පරීක්ෂා කර බලා මෙරටට රැගෙන එන ලදී.

**කටුනායක ගුවන් තොටුපොල සත්ව නිරෝධායන ආයතන පරිශ්‍රයේදී පොලිස් මාධ්‍ය ප්‍රකාශක සහ අපරාධ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති නීතිඥ නිහාල් තල්දුව මහතා විසින් මෙම සුනඛයින් භාර ගන්නා ලදී.**

මෙම සුනඛයන් කටුනායක ගුවන් තොටුපොල ගුවන් භාණ්ඩ පර්යන්තයේ සිට ගුවන් තොටුපොල සත්ව නිරෝධායන ආයතනය වෙත රැගෙන විත්, එහි පශු වෛද්‍ය නිලධාරීන් විසින් පරීක්ෂා කිරීමෙන් පසුව පොලිස් නිල සුනඛ අංශය වෙත රැගෙන යාම සඳහා එම සුනඛයන්ගේ පුහුණුකරුවන් වෙත භාර දීමට පියවර ගෙන ඇති අතර මාස 03 ක කාලයක් නිරෝධායනය කිරීමෙන් අනතුරුව මෙම සුනඛයින් මත්ද්‍රව්‍ය වැටලීම් හා අපරාධ මර්ධන රාජකාරී සඳහා යෙදවීමට නියමිතය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්













පොලිස් මාධ්‍ය කොට්ඨාසය.